**ශීර්ෂය 244 - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 244 - **වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ** 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 සැප්තැම්බර් 28 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

---

### 2.1 විසර්ජන ගිණුම

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,161.76ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,161.01 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 0.76 ක හෙවත් සියයට 0.07 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 1,157.09 | 1,156.56 | 0.53 | 0.04 |
| මූලධන | 4.67 | 4.45 | 0.23 | 4.86 |
| **එකතුව** | **1,161.76** | **1,161.01** | **0.76** | **0.07** |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 24401 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 2.50 | 2.15 | 1.20 | 1.86 | 12.00 | 7.95 |

## 2.3 විගණන නිරීක්ෂණය

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 විසර්ජන ගිණුම

වැය විෂයයන් 02 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 27 ක් හා සියයට 33 ක් වී තිබුණි.

### 3.2 වත්කම් කළමනාකරණය

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.5 ඡේදය ප්‍රකාරව, සෑම මුදල් වර්ෂයකම පෙබරවාරි 26 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ ඇතුළත් ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩවලින් විනාශ කළ යුතු භාණ්ඩ විනාශ කර අවසන් කළ යුතු වුවද, ඒ සඳහා කමිටුවක් පත් කර තිබුණු නමුත් 2016 අප්‍රේල් 25 දින වන විටත් ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ආ) විගණනයට ඉදිරිපත් කරන ලද සමීක්ෂණ වාර්තාව අනුව, නිරීක්ෂණය වූ අතිරික්තතා හා ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 757(2) (අ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.4 අනුකූල නොවීම

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 2010 ඔක්තෝබර් 11 දිනැති අංක මු.ක්‍ර.අ.01/2010/01 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛය හා 2015 මැයි 15 දිනැති අංක මු.අ.01/2015/01 දරන මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ 03 ඡේදය | ඇ. ඩොලර් 460 හා රු.28,713 | විදේශ රාජ්‍ය/ප්‍රදායක ආයතනය මඟින් එතෙරදී දරනු ලබන ගමන් වියදම්, දුරකථන ගාස්තු වැනි අනියම් වියදම් පියවා ගැනීම සඳහා කිසියම් මුදලක් නොගෙවන විටදී පමණක් ගෙවිය යුතු අනියම් දීමනාව එසේ විදේශ රජය/ආයතනය මඟින් ගෙවා තිබූ අවස්ථාවල ඒ පිළිබඳව නොසලකා දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරින්ට අවස්ථා 05 කදී ඇ. ඩොලර් 460 හා රු.28,713 ක් ගෙවීම් කර තිබුණි. |
| **(ආ)** | 2010 ඔක්තෝබර් 11 දිනැති අංක මු.ක්‍ර.අ.01/2010/01 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ 9 ඡේදය | - | ඉස්ලාම්බාද්හි පැවැත්වීමට නියමිතව තිබූ පාකිස්ථාන් - ශ්‍රී ලංකා Joint working group සාකච්ඡාවට සහභාගිවීම සඳහා නිලධාරිනියක් වෙත අනියම් හා සංයුක්ත දීමනාව ලෙස US$ 750 (රු.99,951 ) ක් ගෙවා තිබුණද අදාල වැඩසටහන අවලංගුවීම නිසා මෙම මුදල ආපසු දෙපාර්තමේන්තුවට ගෙවීමට කටයුතු නොකර එම නිලධාරිනියගේ වෙනත් සංචාරයකට හා වෙනත් නිලධාරිනියකගේ භූතාන සංචාරයකට හිලව් කළ බව හා ඉතිරි මුදල ලෙස US$ 126 (රු.16,084) ක් ආපසු ගෙවා තිබුණි. |

**3.5 කාර්යසාධනය**

-----------------

2015 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. ක්‍රියාකාරී සැලැස්ම තුළ කාර්යයන් 40 ක් ඇතුළත් කර තිබුණු අතර ඉන් කාර්යයන් 16 ක් එනම් සියයට 40 ක් සම්බන්ධයෙන් කටයුතු කරනුයේ, " සිදුවුවහොත් හෝ ඉල්ලීම් කළහොත්" (if arisen or if requested) පමණි" යන්න සඳහන් කර තිබුණි.

(ආ) වර්ෂ ගණනාවක සිට දෙපාර්තමේන්තුව ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදි තෝරාගත් කාර්යයන් කිහිපයක් පමණක් ඇතුළත් කර තිබුණි. දෙපාර්තමේන්තු කාර්යයන් තුළ ඇතුළත් සැලැසුම් සකස් කිරීමේ කාර්යයන්, ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කිරිම සිදු නොවන බවත් නිරීක්ෂණය විය.

**(ඇ) රේගු කටයුතුවලට අදාළ අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීම**

---------------------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පුද්ගලික පාර්ශ්වයක් විසින් 2015 පෙබරවාරි 12 දින රේගු පරීක්ෂණයට අදාළව අභියාචනයක් ඉදිරිපත් කර තිබුණි. 2015 පෙබරවාරි 20 දින මේ පිළිබඳව රේගු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් නිරීක්ෂණ විමසා තිබුණි. නමුත් මේ පිළිබඳව ඉදිරි ක්‍රියාමාර්ග ගත් බවට විගණනයට තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2015 ජනවාරි 23 දින දෙපාර්තමේන්තුවට විනිමය පාලන පනතේ 26 වන වගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය පාලන දෙපාර්තමේන්තුවෙන් 2015 පෙබරවාරි 09 දිනැති ලිපියෙන් හා 2015 දෙසැම්බර් 08 දිනැති සිහි කැඳවීමේ ලිපිය මඟින් ඊට අදාල නිරීක්ෂණ ලබා දෙන ලෙස ඉල්ලීම් කර තිබුණ ද, ලිපි ගොනුව අනුව 2015 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිරි කටයුතු සිදු කර නොතිබුණි.

**(ඈ) ඉදිරි ගෙවීම් ක්‍රම යටතේ රේගු ගාස්තු නිරවුල් කිරීම සඳහා භාණ්ඩ නිෂ්කාශනය කිරීමට අදාළ අනුමැතීන් ලබාදීම**

---------------------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රාජ්‍ය ආයතන සඳහා ආනයනය කරනු ලබන භාණ්ඩ වෙනුවෙන් රේගු බදු ගෙවීමට එම අවස්ථාවේදී ආයතනවලට සලසා ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන විට අදාළ භාණ්ඩ අප්‍රමාදව නිදහස් කර ගැනීම සඳහා එම භාණ්ඩ වෙනුවෙන් ගෙවිය යුතු රේගු බදු වර්ෂය අවසානයේදී ඉතිරි වූ ප්‍රතිපාදන මගින් ගෙවීමේ එකඟතාවය මත භාණ්ඩ නිදහස් කිරීමට දෙපාර්තමේන්තුව විසින් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ/රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ ද නිර්දේශයන්/එකඟතාවයන් /නියෝගයන් අනුව අනුමැතිය ලබා දී තිබුණි. ඊට අදාළ නිරවුල් කිරීම් නිසි කාලය තුල සිදු නොවීම පිළිබඳව අනුමැතිය ලබාදුන් ආයතනය විසින්ද පසු විපරමක් හෝ සිදු නොකිරීම හේතුවෙන් 2007 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලයට අදාළ එම හිඟ බදු මුදල රු.19,497,552,935 ක් වී

තිබුණි. මෙම හිඟ මුදල්වලට අදාළ 2015 වර්ෂය අවසානයේ හා 2016 වර්ෂයේදී සිදුවී ඇති ලිපි ගනුදෙනුවීම් අනුව ඒවා අයකර ගත නොහැකි තත්ත්වයට පත්ව ඇති බව නිරීක්ෂණය විය.

(ii) මේ සම්බන්ධව විධිමත් ලේඛනයක් හෝ දෙපාර්තමේන්තුව විසින් පවත්වා නොතිබුණි. එම අනුමැතීන්වලට අදාළව භාණ්ඩ නිෂ්කාශනය කර ගැනීම පිළිබඳව හෝ දෙපාර්තමේන්තුව දැනුවත් වී නොතිබුණි. එසේ වුවද දෙපාර්තමේන්තුව විසින් මේ සඳහා අනුමැතිය දීමේදි, මේ යටතේ ආනයන කරනු ලබන භාණ්ඩ දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියකින් තොරව විකිණීම, කුලීයට හෝ බදු පදනම මත හෝ වෙනයම් ආකාරයක ඉවත් කිරීමක් කළ නොහැකි බවට කොන්දේසියක්ද අදාළ ලිපිවල ඇතුළත් කර තිබුණි.

(iii) නියැදි පදනමක් මත තෝරාගත් ලිපිගොනු කිහිපයක් පරීක්ෂා කිරීමේදී, එසේ හිඟ හිටි මුදල් ගෙවිය නොහැකි බවට හේතු වූ කරුණු ලෙස අදාළ අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක නොවීම, අමාත්‍යාංශයෙන් නිර්දේශයන් ලබාදුන් බවටද කරුණු තහවුරු නොවීම, ආනයනය කරන ලද භාණ්ඩ සම්බන්ධ විස්තර/ ලිපිගොනු සොයා ගැනීමට අපහසු වීම හා ලබා දී ඇති අයවැය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම යන කරුණු අදාළ ආයතන විසින් දන්වා තිබුණි. මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව හෝ ජාතික අයවැය දෙපාර්තමේන්තුව හෝ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

**(ඉ) සහනදායී මෝටර් රථ බලපත්‍ර නිකුතුව**

**-----------------------------------------**

2007 වර්ෂයේ සිට 2015 නොවැම්බර් 20 දින දක්වා දෙපාර්තමේන්තුව විසින් වරින් වර නිකුත් කළ චක්‍රලේඛ පදනම් කර ගෙන සහන කොන්දේසි යටතේ රාජ්‍ය නිලධාරීන් සඳහා වාහන ආනයනය කිරීමේ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබුණි. එසේම, රාජ්‍ය සේවයේ විශ්‍රාම ගන්නා ලද ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් සඳහා මෙන්ම විදේශ දූත මණ්ඩලයන්හි සේවා කාලය අවසන් කොට නැවත ශ්‍රී ලංකාවට පැමිණෙන නිලධාරීන් සඳහා ද මෝටර් රථ ආනයන බලපත්‍ර නිකුත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුව විසින් ඊට අදාළ යාවත්කාලීන දත්ත පද්ධතියක් පවත්වා නොතිබුණි. අංක 165 දරන විදේශ කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව 2008 වර්ෂයේදී සහනදායී මෝටර් රථ ආනයන බලපත්‍රයක් ලබා ගෙන තිබුණු ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරියෙකු වෙත සත්‍ය තත්ත්වය අනාවරණය නොවීම නිසා 2011 ජුනි 07 දින නැවතත් බලපත්‍රයක් නිකුත් කිරීමෙන් රජයට අලාභ සිදු වී තිබුණි.

(ii) 2006 අප්‍රේල් 25 දිනැති අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව වාහන බලපත්‍ර ලබා ගැනීම සඳහා ජ්‍යෙෂ්ඨ මට්ටමේ වසර 06 ක අඛණ්ඩ හා සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරීන්ට වුවද, දකුණු පළාත් සභාවේ ප්‍රධාන ලේකම් විසින් විශ්‍රාමික අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් 42 දෙනෙකු සඳහා සහනදායී මෝටර් රථ ආනයන බලපත්‍ර ලබා දී තිබුණි

(iii) නියැදි විගණන පරීක්ෂාවකදී අනාවරණය වූ පරිදි, ඉහත සඳහන් නිලධාරීන් අතර වූ එක් නිලධාරියෙකු වෙත ලබා දුන් බලපත්‍රයක් මඟින් ආනයනය කරන ලද වාහනයක්

වෙනුවෙන් ලබා දී තිබූ බදු සහනය රු. 4,165,329 ක් විය. ඒ අනුව ඉහත කී සියළු කරුණු මගින් රජයට අහිමිවී තිබූ බදු වටිනාකම විශාල අගයක් ගෙන තිබුණි.

(iv) මේ යටතේ වූ බදු ලබාදීම්වලට අදාළව රේගු ආඥා (සංශෝධිත) පනතේ 19(අ)(1) හා 19(අ)(2) අනුව කටයුතු කිරීම දෙපාර්තමේන්තුවේ කාර්යයක් වී තිබුණත්, ඊට අදාළව කිසිදු ඉදිරි පියවරක් ගෙන නොතිබුණි.

(ඊ) **රේගු ආඥා (සංශෝධිත) පනතේ 19 (අ) (1) හා (2) වගන්තිය යටතේ තීරු බදු ඉවත් කිරීම් සම්බන්ධීකරණය කිරීම**

---

යම් තැනැත්තෙකු විසින් අපනයනය කරන ලද, නැතහොත් ඔහු නමට ප්‍රේෂණය කරන ලද යම් භාණ්ඩයක් නියමයෙහි සඳහන් විය හැකි කොන්දේසිවලට යටත්ව, ඒ සඳහා අය කළ යුතු රේගු තීරු බදු සියල්ලෙන් හෝ ඉන් කොටසකින් නිදහස් කිරීම කළ හැකි බව පනතේ 19(අ)(2) වගන්තියේ සඳහන් වේ. එසේ සිදු කළ සෑම නියමයක්ම, ගැසට් පත්‍රයෙහි පල කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින් එය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු බවත් සඳහන් වේ. එමෙන්ම මෙම නියමයන් ගැසට් පත්‍රයෙහි පල කරනු ලැබීමෙන් පසු දින 60 ක් ඇතුළත පාර්ලිමේන්තුව විසින් ඒ නියමය යෝජනා සම්මතයක් මගින් ප්‍රත්‍යාදිෂ්ය කළ හැකි අතර එවැනි අවස්ථාවක, නිදහස් කරනු ලැබූ භාණ්ඩ සඳහා ගෙවිය යුතු රේගු තීරු බදු පනතේ 145 වන වගන්තියේ විධිවිධාන යටතේ අයකර ගත හැකිය.

(i) ඒ අනුව ඊට අදාළ කටයුතු වෙළඳ හා ආයෝජන දෙපාර්තමේන්තුවෙන් සිදු කරනු ලබන බව කාර්යයන් වල සඳහන් වූවද, විගණනයට ඉදිරිපත් කළ ලිපිගොනු අනුව, 2011 අගෝස්තු මාසය දක්වා තීරු බදු සහන ලබාදීම් පමණක් ගැසට් පත්‍රයේ පළකර පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අදාළ කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදු කර තිබුණි.

(ii) මෙසේ ලබා දුන් බදු සහන "ගැසට් පත්‍රයේ පළකර දින 60ක් තුළ පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයකින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබුවහොත් නිදහස් කරනු ලැබූ භාණ්ඩ සඳහා ගෙවිය යුතු රේගු තීරු බදු ඒ භාණ්ඩවල ආනයනකරු විසින් හෝ ප්‍රේෂණලාභියා විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ගෙවිය යුතුය" යන ඉහත කී අවශ්‍යතාවයට අනුකූලවීමක් සිදු වී නොතිබුණි.

(උ) සාර්ක් සංවර්ධන අරමුදලට අදාළ සියළුම කටයුතු පිළිබඳ සොයා බැලීම දෙපාර්තමේන්තුවේ එක් කාර්යයක් වී තිබුණි. ඒ යටතේ අරමුදලේ මූල්‍යමය අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවලට අදාළ ඍජු අධීක්ෂණයක් කිරීමට කටයුතු කර තිබුණි. ඊට අදාළ ව්‍යාපෘතිය අවසන් වී තිබුණද, අරමුදලින් ඉල්ලන ලද කාර්යසාධන වාර්තාව, ප්‍රගතිය, මූල්‍ය හා සමාජ තක්සේරුව හා ස්වාධීන විගණන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. 2013 හා 2014 වර්ෂවල ආරම්භ කර තිබූ ව්‍යාපෘතිවල කටයුතු ප්‍රමාද වී තිබීම, ව්‍යාපෘතිය යටතේ ගෙන්වන ලද ඇ.ඩො.27,335 ක් වටිනා පර්යේෂණ අත්වැසුම් තොගයක් ගුවන් තොටුපලින් 2015 අගෝස්තු 13 දින වන විටත් නිදහස් කර ගෙන නොතිබුණි. මේ නිසා ඊට අදාළ ප්‍රමාද ගාස්තුවක් ගෙවීමට සිදුවීම වැනි හේතු නිසාවෙන් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටුකිරීම සම්බන්ධව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

## 3.6 මතභේදයට තුඩුදෙන ගැටළු

සාර්ක් සංවර්ධන අරමුදලේ මූලික ප්‍රාග්ධනය සඳහා ශ්‍රී ලංකාවේ දායකත්වය ලෙස 2010 වර්ෂයේ සිට ඇ.ඩො. 6,432,000 ක් බැගින් එනම් ඇ.ඩො. 32,160,000 ක් වූ වාරික පහක් ගෙවිය යුතුව තිබුණි. 2014 වර්ෂය අවසාන වන විට ඉන් වාරික 5 ක් ගෙවා අවසන් කළ යුතු විය. ඒ අනුව ඇ.ඩො. 8,146,000 ක් සඳහා 2015 අයවැය ඇස්තමේන්තුවෙන්, රු.1,083,500,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. ඉන් පළමු කොටස ලෙස 2015 අගෝස්තු 11 දින ඇ.ඩො. 4,073,000 ක් එනම් ශ්‍රී ලංකා රු.544,763,750 ක් ගෙවා තිබුණු අතර දෙවන කොටස 2015 ඔක්තෝබර් 05 දින ඇ.ඩො.4,073,000 ක් එනම් රු.575,352,387 ක් ගෙවා තිබුණි. මේ සඳහා 2015 වර්ෂයේදී ප්‍රතිපාදන සලසා ගෙන තිබියදීත්, නියමිත පරිදි අදාල වාරික නොගෙවා ප්‍රමාද කිරීම හේතුවෙන් විනිමය අනුපාතිකයේ වෙනස් වීම මත රු.36,616,137 ක් වැඩිපුර ගෙවීමට දෙපාර්තමේන්තුවට සිදුවී තිබුණි.

## 3.7 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දින දෙපාර්තමේන්තුවසේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක සංඛ්‍යාව | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 14 | 12 | 02 |
| (ii) | ද්විතියික මට්ටම | 30 | 29 | 01 |
| (iii) | ප්‍රාථමික මට්ටම | 13 | 13 | - |
| | **එකතුව** | **57** | **54** | **03** |